**මාතර මහා නගර සභාව - 2020**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1. තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

මාතර මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මාතර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණ ණය ගිණුමේ රු. 49,774,022 ක ශේෂයක් පැවති අතර මෙම ණයමුදල සඳහා ණය වාරික හා පොලී ගිණුම්ගත කර නොතිබුණි. | මෙම ණය මුදලට අදාල ගිවිසුම් සම්බන්ධව ගැටළු විසඳාගෙන පොළිය ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබුණු එකතුව රු.337,405 ක් වූ ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනයෙහි රු. 1,290,598 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීම් සිදු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | පුස්තකාල පොත් මිලදී ගැනීමේදී වට්ටම් වශයෙන් ලැබුණු රු. 185,230 ක පොත් ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ඈ) | රු.4,576,000 ක වියදමක් දරා ඉදිකර තිබූ ඉන්ධන පිරවුම්හල ප්‍රාග්ධනිත කර නොතිබුණි. | | |
| (ඉ) | සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතු රු.100,750 ක් විවිධ ණය හිමියන් සහ ගබඩා ණය හිමියන් යන දෙකටම බැර කිරීම නිසා එම ප්‍රමාණයෙන් අතිරික්තය හා ගබඩා ණය හිමියන් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීම් සිදු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ සේවක ණය ගිණුම රු.2,000,561 ක් අඩුවෙන්ද මුදල් මාරු ගිණුම එම වටිනාකමින් වැඩියෙන්ද දක්වා තිබුණි. | | . |
| (උ) | වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා වැය වූ මුදලින් සියයට 35 ක් එනම් රු.37,871,539 ක් සංකීර්ණයේ කඩ කාමර ටෙන්ඩර් කර ලබාගත් පෙර ගෙවීම්වලින් ගෙවා දැමිය යුතු වුවත්, එම මුදල් පියවා මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මෙම ණය මුදල ගෙවීමට පොලී සහනයක් ඉල්ලා ඇති අතර ඒ සඳහා පිළිතුරු ලැබී නොමැති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 62,219,663 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂ හා ඊට අදාල උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන වටිනාකම රු. 58,240,330 ක් වූයෙන් රු.3,979,333 ක වෙනසක් පැවතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 05 කට අදාලව එකතුව රු. 67,037,964 ක් වූ ගිණුම් ශේෂ අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | මේ වන විට යාවත්කාලීන කරමින් පවතින බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

--------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

--------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදය | | | |
| 5:4:1 වගන්තිය සහ 2016 අගෝස්තු 16 දිනැති අංක 04/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු නාගරික කොමසාරිස් නිල නිවාසයෙන් 2012 සැප්තැම්බර් සිට 2019 ජූලි 31 දක්වා කාලය තුල නිල නිවාස කුලී රු.289,872 ක් අයකරගෙන නොතිබුණි. | 1947 අංක 16 දරන මහා නගර සභා ආඥා පනත යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව මහා සභාව විසින් තීරණය කර ඇති බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය |

**2. මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.91,331,461 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.122,101,310 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

------------------------

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

----------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් හිඟය රු.55,075,936 ක් විය. | හිඟ ලැයිස්තු කාර්තු වශයෙන් ලබාගෙන ආදායම් පරීක්ෂක හා දේපළ තහනම් කිරීමේ නිළධාරීන් යොදවා අයකර ගැනීමට සියලු ප්‍රයත්නයන් ගෙන ඇති බව. | හිඟ වරිපනම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.49,608,219 ක හිඟ කඩ කුලී ශේෂයක් පැවතුණි. | හිඟ කුලී අය කර ගැනීමට සෑම ප්‍රයත්නයක්ම දරා ඇති බවත් කොවිඩ් වසංගතය නිසා ව්‍යාපාර වසා දැමීම හා අඩපණ වීම මත බදු අය කර ගැනීමට නොහැකි වූ බව. | හිඟ කුලී කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) | සමලෝචිත වර්ෂය අවසානයට හිඟ බිම්බදු රු.7,723,418 ක් විය. | කොවිඩ් වසංගතය හේතුවෙන් ව්‍යාපාර වසා දැමීම හෝ අඩපන වී ඇති බැවින් බදු ගෙවීමට නොපැමිණීම මත හිඟ ශේෂය වැඩි වන බව. | හිඟ බිම්බදු කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

**කාර්යසාධනය**

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාතර මහා නගර සභාව සතු කොප්පරාවත්තේ මහානාම අනුස්මරණ ප්‍රජා ශාලාවේ වර්ග අඩි 7744 ක ප්‍රමාණයක් බාහිර පාර්ශවයක් වෙත සභා අනුමැතියකින් හා සභාවට ගාස්තු ගෙවීමකින් තොරව, පෞද්ගලික කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා ලබා දී තිබුණි. | සභා තීරණය අනුව ඊළඟ මුදල් හා ප්‍රතිපත්ති ස්ථාවර කාරක සභාවට වාර්තාවක් ලබා දීමට කටයුතු කරන බව. | සභාව සතු ස්ථාවර වත්කම් විධිමත් පරිදි බදු දීම සිදු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාතර මහා නගර සභාව විසින් දෛනිකව එක්රැස්වන කසල ටොන් 35 ක් පමණ වර්ගීකරණය කර ලබාගෙන කොටවිල කසල අංගනයට වෙන් කිරීමකින් තොරව බැහැර කර තිබුණු අතර, කසල තුනී කිරීම සඳහා 2018 මැයි 18 සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුල ස්කැවේටර් යන්ත්‍රයක් කුලියට ලබාගෙන පැය 5671 ක් සඳහා රු. 26,934,997ක් වැය කර තිබුණි. කසල භාවිතයෙන් ජීව වායු නිපදවා ඒ මගින් විදුලි බලය නිපදවීමේ හා කාබනික පොහොර නිපදවීමේ ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | කසල මගින් විදුලිය නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ව්‍යාපෘතියට කසල ලබා ගැනීම ආරම්භ කළ වහාම මෙම ස්කැවේටර් යන්ත්‍රයෙන් ලබා ගන්නා සේවය නතර කිරීමට නියමිත බව. | විධිමත් කසල කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කළ යුතුය. |